# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## 1976 දෙසැම්බර් 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(76. 12. 29 දින නිකුත් කරන ලදී.)

## බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය
## (සංස්ථාගත කිරීමේ)

**බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ආණ්ඩුවේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

## බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් බදුල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කීපය මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහාජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක      දරන බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු, මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන එකී බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතියේ තත්කාලයේ සභාපති, උප සභාපති හා විධායක කමිටුවේ සාමාජිකයෝ ද එකී බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතියේ සාමාජිකයන්ව දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝ ද "බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නාහ. එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම එකී නාමයෙන් කළ යුතු ද, කළ හැකි ද වන්නේ ය. තව ද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් ඇතිව සිටීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. බදුල්ලේ ශ්‍රී සද්ධර්මානන්ද සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී සද්ධර්මානන්ද පිරිවෙණෙහි උන්නතිය සඳහා කටයුතු සංවිධානය කිරීම ;

(ආ) පාරිවෙණික අධ්‍යාපන කටයුතු දියුණු කිරීම ;

(ඇ) නේවාසික සියලුම භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම ;

(ඈ) පිරිවෙන් විහාරස්ථානයෙහි අභිනවයෙන් ගොඩනැගිලි ඉදි කිරීම හා තිබෙන ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම ;

(ඉ) ශිෂ්‍ය නිවාසයට හා පිරිවෙණට අවශ්‍ය උපකරණ සැපයීම ;

(ඊ) ප්‍රදේශවාසී බෞද්ධ ජනතාවගේ ආගමික කටයුතු දියුණු කිරීම සඳහා විහාර මන්දිරයක් ලබාදීම ;

2—ඒ 24189 — 6,945 (76/12)

(උ) දහම් පාසැලේ අභිවෘද්ධිය ඇති කිරීම;

(ඌ) ධර්ම දේශනා පැවැත්වීම හා බෞද්ධ කටයුතු දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන යෙදීම.

*විධායක කමිටුව.*

4. (1) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීති අනුව තෝරා පත් කරගනු ලබන තැනැත්තන් ගණනාකින් සමන්විත වන විධායක කමිටුවක් විසින් සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබේ.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි ධුර දරනා සමිතියේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව වන්නේ ය.

*සංස්ථාවේ රීති.*

5. (1) සාමාජිකයන් ඇතුලත් කර ගැනීම, අස්වීම හෝ නෙරපීම සඳහා ද, සංස්ථාවේ විධායක කමිටුවේ හා විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ යුතුකම් ඉටුකිරීම සම්බන්ධයෙන් සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී හා වැඩි ඡන්දයෙන් රීති සෑදීම නීත්‍යානුකූල වන්නේය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව කළ හැකි වන්නේ ය.

(2) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා කිසිදු රීතියක් හෝ මින් මතු සම්මත කරගනු ලබන කිසිදු රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතු ය. එහෙත් එකී වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම විධායක කමිටුව විසින් කලින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දිනයෙහි බලපවත්නා සමිතියේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබේ.

*සමිතිය විසින් ගෙවිය යුතු ණය හා සමිතියට අය විය යුතු ණය.*

6. මෙම පනතේ කාර්යයන් සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහිදී පවත්නා සමිතියේ සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සමිතියට අය විය යුතු සියලු ණය හා සමිතියට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.*

7. විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

*සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තුවකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල කවර දේපළක් වුව ද භාර ගැනීමටත්, දැරීමටත් නීතිය අනුව සංස්ථාවට හැකියාව ඇත්තේ ය. තව ද විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව එකී සියලු දේපල දැරිය යුතු ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

9. මේ පනතෙහි සඳහන් වූවන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවික හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.